සුබස් සිතිවිලි

සීය ආව; නෑව; කෑව; (ආපහු) ගිය.
සීයා ආවා; නෑවා; කෑවා; (ආපහු) ගියා. මේ වැකකි දෙකම හරි ද ?

ඉංගිරිසියේ ACCOUNT (අ'කවින්ට්) - EARTH (අ'ත්) CONTAINER (ක'න්ටේන) CURD (කා'ඩ්) GUFFAW (' VERY LOUD LAUGH) (ග'ෆෝ) GIRL (ගා'ල්) වැනි සංවෘත 'අ' හඬ ඇතිව පටන් ගන්නා බොහෝ වචන ඇතත් සිය බසේ ("කර" දවෙන් හැඳෙන) කර, කල / කළ කරන, කරවන, කරත, කරව, කරමින් ආදි ක්‍රියා පදත්, ද, ම, ය, ළ, ව, හ ආදි නිපාත පදත් හැරෙන්නට සංවෘත හඬ ඇතිව පටන් ගන්නා වෙනත් වචන ඇති බවක් නොපෙනේ.

ඉංගිරිසියන් "IRVIN" (ආ'වින්) කියන විදියත් අප "අර්වින්" කියන විදියත් එකිනෙකට වෙනස් ය. අප, අර් - නෝලිස්, අර්ජුන, අර්තාපල් කියන්නේ අපේ බාසා රීතියට අනුවයි - සිය බසේ හැම අකුරක්ම නිවැරදිව කියවිය යුතුය. (වාක්‍යය - විර් - ක - යා ලියා වුර් - ක - යා කීම ගැන පසුව කතාබහ කරමු.)

ඉංගිරිසියන් CURD - CURTAIN කියවන

වි ක ධර්මබන්ධු

විදියත් අප කර් - මාන්ත, කර් - කශ, කර් - නේලිස් කියවන විදියත් එකිනෙකට වෙනස්ය. අප පර්වත, පර්ෂ ද කියවන විදියට පර්ත්, බර්ලින්, ජර්මන් නොකියවමු.

මේ ගැටය ලිහිය යුතුය. ශ්‍රී ලංකා ශබ්දවාහිනිය රෑ දවල් මතුරන, "හෙළ බස පතුරවමු - සිව්-දෙස දන මන තුටු කරනා" යන්න අර්තවත් කල යුතුය. පවතින යතුරු පුවරුව ම බාවිතා කරමින් මෙය කල හැකිය.

1. අ' හෝ අ! - අ'කවින්ට්, අ'කෝඩියන් හෝ අ!කවින්ට්, අ!කෝඩියන්
ආ'නස්මි, ආ'වින් හෝ ආ!නස්ට්, ආ!වින්
ක'මෝඩ්, ක'මිපියුට හෝ ක!මෝඩ්, ක!මිපියුට
කා'ඩ්, කා'ටින් හෝ කා!ඩ්, කා!ටින්

2. ඉකවින්ට්, ඉකෝඩියන්, ඊනස්ට්, ඊවින්
කෟමෝඩ්, කෟමිපියුට, කෟඩ්, කෟටින්

මේ ක්‍රමයට ලිවීමේ දී යතුරු පුවරුවේ කිසිදු වෙනසක් කල යුතු නැත.

බල්ලා නාවා ලා සීයා නානවා
බල්ල නාවල සීය නානව

මේ වැකි දෙක කියවිය යුත්තේ දෙවිදියකටය. පලමු වැන්න ලියන බස සඳහා බාවිතා කරන අතර දෙවැන්න දෙඩන බස සඳහා බාවිතා කෙරේ. සිය බසේ රීතිය අනුව ("හ" හැර) පදයක අග ඇති 'අ' ස්වරය සංවෘත ව කියවිය යුතුය. එසේ කියවන විට බල් - ල නාව - ල සී - ය නාන - ව යනුවෙන් අග අකුර ඉබේට ම සංවෘත ව කියවේ. පන් සීය, නාවල නැන්දා කියවන විදියට ය. සීදේවි චිත්‍ර පටියේ සංවාද කෙරෙන්නේ ලියන බාසාවේ සිංහල. අදත් සමහර නාට්‍යවල රාජසබාවේ සංවාද බර වචන යොදා ලියන බාසාවෙන් කෙරෙන සැටි ඔබ අසා දැක ඇතැයි සිතමි.

එහෙත් "නවලුවක" සංවාද ලියන්නේ දෙඩන බාසාවෙනි.

"මම අම්මව එයා පෝට් එකට දාලා එන්නම්. පුතයි දුවයි කෑම කාලා නිදා ගන්න. මියුරි ඇන්ටිත් ඉන්නවා ඔය ගොල්ලත් එක්ක."
"අද මම ටිකක් කලින් ගෙදර ආවා. මම එනකොට මෙයා මහ හයියෙන් කාමරේ ඉඳන් වීඩියෝ වගයක් බලනව. එයාගෙ යාලුවො දෙන්නෙකුත් හිටිය." (ගනේවත්ත පාලිතයන්ගේ "ඇවිත් නොරටක" නවලුවෙනි). මෙහි (අම්මාව) අම්මව, (පුතායි දුවයි) පුතයි දුවයි, (ඔය - ගොල්ලාත්) ගොල්ලත්, (බලනවා) බලනව, (එයාගේ යාලුවෝ) එයාගෙ යාලුවො, (හිටියා) හිටිය, ලියා ඇත්තේ දෙඩන බාසා-වෙනි. එහෙත් (දාලඃ) දාලා, (කාලඃ) කාලා, (ඉන්නවඃ) ඉන්නවා, (ආවඃ) ආවා, (මං) මම ලියා ඇත්තේ ලියන බාසාවෙනි.

බොහෝ දෙනා ලියන විදියට මෙහි "පුතයි දුවයි" ලියා ඇතත් එය නිවැරදිව කියවෙන්නේ "පුතයි දුවයි" කියවෙන විදියට නොවේ. දුවයි සේනකයි - දුවයි සේනකයි කියවීමේ දී හල් අකුරට පෙර ව ඇති 'අ' ස්වරය විවෘතව කියවිය යුතු අතර 'ඉ' 'උ' ස්වරය සහිත අකුරකට පෙර ව ඇති 'අ' ස්වරය සංවෘත ව කියවිය යුතුය.

කර - ති / කරත්, බල - ති / බලත්, කර - මි, කර - මු/ කරමි, බලමි, බල -මු / බලමු (ගිරාහු) ගිර - වු / ගිරවි පිලියම / පිලියම්, කියත / කියත්, නියන / නියන් නියඟ / නියං, සුලඟ / සුලං නිදසුනකි. බොහෝ දෙනා ය් / වි වෙනුවට යි / වු ලියන්නේ කවර හෙයින් දැයි නොදනමි.

අය්යා / අව්ව නිවැරදි ව කියවා අයියා /අවුව ත් නිවැරදි ව කියවන්න. "යි" හැඳෙන්නේ "ය් + ඉ" එකතු වීමෙන් බවත් "වු" හැඳෙන්නේ "ව් + උ" එකතුවීමෙන් බවත් අමතක නොකරන්න.

ඉහත දක්වා ඇති සංවාද කැඩි දෙක මා ලියන්නේ,
"මං අම්ම:ව එයා පෝට් එකට දාලඃ එන්නං පුතයි දුවයි කෑම කාලඃ නිදා ගන්න. මියුරි ඇ(ණ්)න්ටිත් ඉන්නවඃ ඔය ගොල්ලත් එක්ක"
"අද මං ටිකක් කලිං ගෙදර ආවඃ මං එන කොට මෙයා මහ හය්යෙං (කාමරේ ඉදං) වීඩියෝ වගයක් බලනවඃ එයාගෙ යාලුවො දෙන්නෙකුත් හිටියඃ මහ හය්යෙං කාමරේ ඉදං - වීඩියෝ වගයක් යන දෙතැන අදහස

ස්තුතියි

විටිල්ලී කවුන්සිලය සඳහා සහිකයන් තෝරාපත් කර ගැනීම සඳහා වූ මැතිවරණයට ඉදිරිපත් වූ මට ඔබ සැම දැක්වූ සහයෝගයට සහ කැපවීමට ස්තුතියි

දින කීපයක් වැනි ඉතා කෙටි කාලයකදී මැතිවරණයට ඉදිරිපත් වී අප ලබාගත් ඡන්ද ප්‍රමාණය එක්තරා ආකාරයක ජයග්‍රහණයක් යයි මම සිතමි අපේ ඉදිරි මැතිවරණ සඳහා මෙය ඉතා හොඳ පදනමක් වනු ඇතැයි ද මම විශ්වාස කරමි

මේ කර්තව්‍යයේදී මා හා අත්වැල් බැඳ ගත් ඔබ සැම මට ශක්තියක් හා ධෛර්යයක්ම විය

ඔබ සියලු දෙනාටම මගේ ස්තුතිය පුද කරන්නට මෙය අවස්ථාව කර ගනිමි

පුෂ්පා ජයකොඩි

නොගැලපේ.
මහහය්යෙං කාමරේ ඉදීමත් එක්වර වීඩියෝ කීපයක් බැලීමත් ය ඒ.

සකු බසින් නයට ගත් (ඃ) විසර්ගය හෙවත් විසර්ජනය ද අපේ හෝඩියේ එක්තරා අංගයකි. ඩිංගිරාල (ඉං) පුංචිරාල (උං) ලියන අපි අනුස්වාරය(ං) හඳුන්නන්නේ "අං" යනුවෙනි. විසර්ගය හඳුන්නන්නේ (අඃ) යනුවෙනි.

"ඍණකතර්තා පිතා ශත්‍රුර්මාතා ච
ව්‍යභිචාරිණී
භාර්යා රූපවතී ශත්‍රුඃ පුත්‍රඃ ශත්‍රුර පණ්ඩිතඃ"

(නය ගන්නා පියා සතුරෙකි. නොමනා (අනාචාර) පැවතුම් ඇති මව සැතිරියකි. රූමත් (.?) බිරිය සැතිරියකි. නුගත් පුතා සතුරෙකි) හිතෝපදේශය - පණ්ඩිතඃ, මස්ථිතාඃ, ප්‍රභූඃ, ශත්‍රුඃ, හෙෂිඃ යන තැන්වල අඃ ආඃ, උඃ ඌඃ, ඊඃ යනුවෙන් යෙදෙතත් අප විසර්ගය හඳුන්වන්නේ "අඃ" යනුවෙනි. කියවීමේ පහසුව සලකා එසේ කියමු.

මනඃකාන්ත 7 මහන්කාන්ත 7 මනස්කාන්ත යන තැන : හැලී ඇත.

හෙදිය, සරසවිය, ලංගම යන වචන දුටු සමහරුන් තප්පු ලෑ හැටි සමහරුන්ට මතක ඇත.

"බල්ලා නාවා ලා සීයා නානවා" යන්න සංවාදයක දී " බල්ලඃ නාවලඃ සීයඃ නානවඃ යන විදියට දෙඩන බසින් ලියන විට ද එබඳුම ප්‍රතිචාර බලාපොරොත්තු විය යුතුය.

LOCAL DELIVERIES

Now hiring courier drivers with
or without a van.

Please fill in your expression of interest
on our website:

www.localdeliveries.com.au/employment